# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**10 ශ්‍රේණිය**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1 යි

**සැලකිය යුතුයි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**

---

★ **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

"විශ්ව ඉංජිනියරින්" නමින් පදිංචිය සඳහා ගෙවල් ඉදිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන විශ්ව පෙරේරා මහතාට 2022 වර්ෂයේ දී හොඳම ඉදිකිරීමේ සම්මානය හිමිවිය. විශ්ව විසින් ම සකස් කරගන්නා හරිත වර්ගයේ සෙවිලි තහඩු පමණක් සිය ඉදිකිරීම් සඳහා භාවිතා කරයි. ඔහු නිවාස සැලසුම්කරණය පිළිබඳ විශේෂ පාඨමාලාවක් ද සාර්ථක ලෙස හදාරා ඇත."

01)මෙම සිද්ධිය සඳහන් "විශ්ව ඉංජිනියරින්" ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?

(1) ආහාර (2) ඇඳුම් (3) නිවාස (4) අධ්‍යාපනය

02)ඉහත සිද්ධියේ සඳහන් "විශ්ව ඉංජිනියරින්" ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(1) ඒක පුද්ගල ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර
(3) සංස්ථාපිත ව්‍යාපාර (4) සමිති සංවිධාන

03)"විශ්ව ඉංජිනියරින්" ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
(2) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(3) මෙම ව්‍යාපාරය සම්බන්ධ විශ්වගේ වගකීම සීමිතය.
(4) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.

04)පහත "x" තීරුවෙහි නිෂ්පාදන සාධක ද "y" තීරුවෙහි ඊට අදළ නිදසුන් ද දක්වේ.

| x තීරුව | y තීරුව |
|---|---|
| A. භූමිය | 1. ගණකාධිකාරී |
| B. ශ්‍රමය | 2. යන්ත්‍ර |
| C. ප්‍රාග්ධනය | 3. ව්‍යාපාර හිමිකරු |
| D. ව්‍යවසායකත්වය | 4. මිනිරන් |

නිෂ්පාදන සාධකවලට නිවැරදි නිදසුන් ගළපා ඇති පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) A - 4, B - 3, C - 2, D - 1 (2) A - 2, B - 1, C - 4, D - 3
(3) A - 4, B - 1, C - 2, D - 3 (4) A - 2, B - 3, C - 4, D - 1

05)ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන් වන ගනුදෙනුකරුවන් ව්‍යාපාරයෙන් අපේක්ෂිත අරමුණක් වන්නේ,
(1) ව්‍යාපාරයේ අනාගත වර්ධනය. (2) අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම යි.
(3) සාධාරණ වැටුපක් ලබා ගැනීම යි. (4) සාධාරණ මිලකට භාණ්ඩ මිලදී ගැනීම යි.

06)ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) කළමනාකරුවන්, පාරිභෝගිකයන්, ගනුදෙනුකරුවන්
(2) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්
(3) සේවකයන්, කළමනාකරුවන්, ගනුදෙනුකරුවන්
(4) අයිතිකරුවන්, පාරිභෝගිකයන්, සේවකයන්

07)ශ්‍රී ලංකාවේ නව රජය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ නව ව්‍යාපෘතියකට අත්සන් කරයි. මෙම සිද්ධියට අදළ ව්‍යාපාර පරිසරය වන්නේ,
(1) ආර්ථික පරිසරය (2) නීතිමය පරිසරය
(3) දේශපාලන පරිසරය (4) ගෝලීය පරිසරය

08)ව්‍යාපාරයක ආර්ථික පරිසර සාධක පමණක් ඇතුළත් වන පිළිතුර සොයන්න.
(1) ආදයම් ව්‍යාප්තිය, උද්ධමනය, පොළී අනුපාතය
(2) ආදයම් ව්‍යාප්තිය, නීතිරීති, සේවා නියුක්තිය
(3) ඉතුරුම්, වයස් ව්‍යුහය, විරැකියා අනුපාතය
(4) විදේශ විනිමය අනුපාතය, තාක්ෂණය, පොලී අනුපාතය

09)ව්‍යාපාර සම්බන්ධයෙන් රජය පනවන අණපනත් සහ නීතිරීති අයත් වන්නේ,
(1) දේශපාලන පරිසරයටයි. (2) සූක්ෂම පරිසරයටයි.
(3) ගෝලීය පරිසරයටයි. (4) නෛතික පරිසරයටයි.

10)ලෝකයේ රටවල් අතර ආර්ථික, සමාජීය, සංස්කෘතික වශයෙන් ඇති අන්‍යෝන්‍ය බැඳීම හඳුන්වන්නේ
(1) ජාත්‍යන්තර සහජීවනය ලෙසය (2) ගෝලීයකරණය ලෙසය
(3) අන්තර්ජාතික සබඳතා ලෙසය (4) විද්‍යුත් වාණිජ්‍ය ලෙසය

11)දක්ෂ කළමණාකරුවෙකු සිටීම හා පුහුණු සේවකයින් සිටීම ව්‍යාපාරයකට,
(1) අවස්ථාවකි (2) ශක්තියකි
(3) වාසියකි (4) තර්ජනයකි

12)ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි ශක්තියක් හා අවස්ථාවක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?
(1) ප්‍රමාණවත් ප්‍රාග්ධනය හා සන්නම් නාමයක් තිබීම.
(2) කළමණාකරුවන්ගේ පළපුරුද්ද හා නව තරඟකරුවන් බිහිවීම.
(3) සේවකයන්ගේ දැනුමෙහි නිපුණතාවය හා කැපවීම සහ වරාය නගරය බිහිවීම.
(4) සුවිශේෂී නිෂ්පාදන ක්‍රම හා සන්නම් නාමයක් පැවරීම.

13) පහත වගුවේ "X" තීරුවෙහි දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන වර්ගය "Y" තීරුවේ දැක්වෙන්නේ එම ව්‍යාපාර සංවිධානවල වාසිය

| X තීරුව | Y තීරුව |
|---|---|
| A. සමූපකාර සමිති | 1. තම දක්ෂතා උපරිමයෙන් භාවිත කිරීම. |
| B. ඒක පුද්ගල ව්‍යාපාර | 2. විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම. |
| C. සංස්ථාපිත සමාගම් | 3. පෞද්ගලික අංශයේ වෙළඳපොළ ඒකාධිකාරය අඩු කිරීම. |
| D. රාජ්‍ය සංස්ථා | 4. ආර්ථික ප්‍රතිලාභ බෙදී යාම. |

ඉහත "X" තීරුව සමඟ "Y" තීරුව ගැළපූ විට "X" හි A, B, C, D සඳහා නිවැරදි පිළිතුර නිවැරදිව දැක්වෙන වරණය වන්නේ

(1) A - 4, B - 3, C - 2, D - 1
(2) A - 1, B - 2, C - 4, D - 3
(3) A - 3, B - 1, C - 2, D - 4
(4) A - 4, B - 1, C - 2, D - 3

14) මුතුමාල දිසානායක, "මුතු කැෆේ" නමින් හෝටලයක් ආරම්භ කිරීමට අදහස් කරයි. මෙම ව්‍යාපාරය හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) මෙම ව්‍යාපාරය ඒක පුද්ගල ව්‍යාපාරයකි.
(2) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(3) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
(4) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් හිමි නොවේ.

15) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින පොදු අවශ්‍යතා හා අරමුණුවලින් යුක්ත සාමාජිකයන්ගේ සාමූහික අයිතිය ඇති ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) සමූපකාර ව්‍යාපාරය
(2) දෙපාර්තමේන්තුය
(3) හවුල් ව්‍යාපාරය
(4) රාජ්‍ය සංස්ථාය

16) ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දැක්වේ.

A. ඒක පුද්ගල ව්‍යාපාර
B. දෙපාර්තමේන්තු
C. සංස්ථාපිත සමාගම්
D. රාජ්‍ය සමාගම්
E. රාජ්‍ය සංස්ථා
F. සමූපකාර

මෙම ව්‍යාපාර සංවිධාන වර්ග අතරින් පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

(1) A, B, C (2) B, C, D (3) B, D, E (4) D, E, F

17) ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක්ද?

(1) ලාභය උපරිම කිරීම
(2) ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම
(3) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම
(4) භාණ්ඩ හා සේවා සැපයීම

18) ව්‍යාපාරයක විවිධ ගනුදෙනු තුළින් බිහිවන ප්‍රතිඵලයක් ලෙස ජනිත වන්නේ,

(1) ගනුදෙනුවක ද්විත්ව ප්‍රතිඵලය යි.
(2) ව්‍යාපාරයේ දළ ලාභය හෝ ශුද්ධ ලාභය යි.
(3) වත්කම්, වගකීම්, වියදම් හා ආදායම් ය.
(4) වත්කම්, වගකීම්, වියදම්, ආදායම් හා හිමිකම් ය.

**19)**වත්කමක දැකිය හැකි ලක්ෂණයක් **නොවන්නේ,**

(1) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම.

(2) ව්‍යාපාරයේ පාලනයට යටත් වීම.

(3) වර්තමාන බැඳීමක් තිබීම.

(4) අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.

20)ව්‍යාපාරයක දැකිය හැකි වගකීමකට නිදසුනක් වන්නේ

(1) ණය ගැතියෝ (2) මෝටර් රථ

(3) ණය හිමියෝ (4) යන්ත්‍ර හා ගොඩනැගිලි

21)ව්‍යාපාරයක අයිතිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය හඳුන්වනු ලබන්නේ,

(1) ව්‍යාපාර ගනුදෙනු ලෙස (2) වගකීම් ලෙස

(3) ව්‍යාපාර හිමිකම් ලෙස (4) වත්කම් ලෙස

22)ව්‍යාපාරයේ දැකිය හැකි ජංගම **නොවන** වත්කම් අයත් කාණ්ඩය තෝරන්න.

(1) මෝටර් රථ, ලී බඩු, යන්ත්‍ර, ගොඩනැගිලි

(2) ඉඩම්, යන්ත්‍ර, මෝටර් රථ, බඩු තොගය

(3) යන්ත්‍ර, ලී බඩු, ණයහිමියෝ, මෝටර් රථ

(4) ණය ගැතියෝ, ලී බඩු, මෝටර් රථ, යන්ත්‍ර

23)ව්‍යාපාරයක ලාභය ගණනය කරනුයේ

(1) වත්කම් - වගකීම් මගිනි (2) ජංගම වත්කම්- ජංගම වගකීම් මගිනි

(3) ආදායම් - වියදම් මගිනි (4) විකුණුම් - වියදම් මගිනි

24)පහත සමීකරණ අතුරින් ගිණුම්කරණ සමීකරණය දැක්වෙන්නේ කවර පිළිතුරේ ද?

(1) හිමිකම් = වත්කම් - වියදම් (2) වත්කම් = හිමිකම - ප්‍රාග්ධනය

(3) වත්කම් = හිමිකම + වගකීම (4) වගකීම් = ආදායම - වියදම

25)වත්කම් වැඩිවීම හා වගකීම් වැඩිවීම ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති විට සිදුවී ඇති ගනුදෙනුව වන්නේ

(1) රු.50 000ක බැංකු ණය ආපසු ගෙවීම

(2) රු.12 500ක මුදලක් ණයගැතියන්ගෙන් ලැබීම

(3) රු.30 000ක බඩු තොගයක් ණයට ගැනීම

(4) සේවක වැටුප් රු.15 000ක් ගෙවීම

26)2022.01.01 දිනට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ අගයන් පහත සඳහන් ලෙස දක්නට ලැබුණි.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| 200 000 | = | 150 000 | + | 50 000 (බැංකු ණය) |

බැංකු ණයෙන් රු.25 000ක් ආපසු ගෙවීමේ දී මෙම ගිණුම්කරණ සමීකරණයේ අගයන් විය යුත්තේ

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 150 000 | = | 150 000 | + | 100 000 |
| (2) | 175 000 | = | 150 000 | + | 25 000 |
| (3) | 225 000 | = | 100 000 | + | 125 000 |
| (4) | 175 000 | = | 25 000 | + | 150 000 |

27)වත්කම් වැඩි වී වත්කම් අඩුවන ගනුදෙනුවක් වන්නේ

(1) රු.5 000 ක් සේවක වැටුප් ගෙවීම
(2) රු.7 500ක යන්ත්‍රයක් ණයට ගැනීම
(3) රු.8 000ක ලී බඩු මිලදී ගැනීම
(4) රු.3 000ක කඩකුලී ආදයම් ලැබීම

28)සිනෙත්ගේ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනුවකදී ගිණුම්කරණ සමීකරණයට එය බලපාන ලද්දේ හිමිකම් වැඩිවීම හා වගකීම් අඩුවීම ලෙසටය. මෙයට අදළ ගනුදෙනුව වන්නේ

(1) සිනෙත් රු.50 000ක් අමතර ප්‍රාග්ධනයක් ලෙස ව්‍යාපාරයට යෙදවීම.
(2) ව්‍යාපාරයේ දනට යොදවා ඇති ප්‍රාග්ධනයෙන් රු.60 000ක් ව්‍යාපාරයේ ණයහිමියන්ට ගෙවීම
(3) සිනෙත් තම පෞද්ගලික මුදලින් රු.6 000ක් ව්‍යාපාරයේ ණයහිමියන්ට ගෙවීම.
(4) රු.100 000ක් ව්‍යාපාරයේ මුදල් පෞද්ගලික ප්‍රයෝජනයට ගෙදර ගෙන යාම.

29)ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බල **නොපාන** සංචරකය කුමක්ද?

(1) ආදයම්
(2) ගැනිලි
(3) බැංකු ණය
(4) අතිරේක ප්‍රාග්ධනය

30)ව්‍යාපාරයේ වැටුප් ගිණුම ........A...... වන අතර විකුණුම් ගිණුම .......B....... ගිණුමක් වේ.
ඉහත A හා B හිස්තැන්වලට වඩාත් ගැළපෙන පිළිතුරු පිළිවෙළින් දක්වෙනුයේ,

(1) ආදයම් හා වියදම්
(2) හිමිකම් හා වියදම්
(3) වත්කම් හා වගකීම්
(4) වියදම් හා ආදයම්

31)ව්‍යාපාරයක ගනුදෙනු සටහන් කර ඇති ලෙජර් ගිණුම් සියල්ල අඩංගු වන්නේ,

(1) ලෙජරයේ ය
(2) බැංකු ප්‍රකාශනයේ ය
(3) බැංකු ගිණුමේ ය
(4) මූලික සටහන් පොතේ ය

32)රු.75 000ක වෙළඳ භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම මෙහි ද්විත්ව සටහන වන්නේ,

(1) මුදල් ගිණුම හර, ගැණුම් ගිණුම බැර
(2) ගැනුම් ගිණුම හර, මුදල් ගිණුම බැර
(3) මුදල් ගිණුම හර, බඩු තොග ගිණුම බැර
(4) බඩු තොග ගිණුම හර, ණයහිමි ගිණුම බැර

33)පහත වගුවේ A තීරුවේ මූලික සටහන් පොත් ද B තීරුවේ එම මූලික සටහන් පොත්වලට අදළ මූලාශ්‍ර ලේඛන දක්වේ.

| A | B |
|---|---|
| 1. මුදල් පොත | P - ගැණුම් ඉන්වොයිසිය |
| 2. බැංකු ගිණුම | Q - ජ'නල් වවුචරය |
| 3. ගැනුම් ජර්නලය | R - තැන්පත් කිරීමේ කුවිතාන්සිය |
| 4. පොදු ජර්නලය | S - ලදුපත්, ගෙවීම් වවුචර් |

ඉහත A තීරුව සමඟ B තීරුව නිවැරදිව ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ

(1) R S P Q (2) S R P Q (3) R P Q S (4) S R Q P

34)ගනුදෙනුවකට අදළ විස්තර වඩාත් පැහැදිලිව දන ගැනීමට අවශ්‍ය නම් පරීක්ෂා කර බැලිය යුත්තේ,

(1) ලෙජරය යි
(2) ලෙජර් ගිණුම් ය
(3) මූලික සටහන් පොත් ය
(4) මූලාශ්‍ර ලේඛන ය

35)ගිණුමක හර පැත්තට වඩා බැර පැත්ත වැඩිනම් ලැබෙන ශේෂය වන්නේ,

(1) හර ශේෂයකි (2) බැර ශේෂයකි

(3) පහළට ගෙන ආ ශේෂයකි (4) ඉදිරියට ගෙන ආ ශේෂයකි

36)කෝසලගේ ව්‍යාපාරයේ ණයගැතියෙකු වූ චාමරගෙන් රු.80 000ක ණය මුදලක් ලැබීමේ දී 5% ක වට්ටමක් ලබා දී ඇත. මෙය කෝසලගේ ව්‍යාපාරයේ,

(1) රු.4 000 ක දුන් වට්ටමකි (2) රු.4 000ක ලද වට්ටමකි

(3) රු.8 000ක දුන් වට්ටමකි (4) රු.8 000ක ලද වට්ටමකි

37)ව්‍යාපාරයක දුන් වට්ටම් වලට අදාළ ද්විත්ව සටහන වන්නේ කුමක්ද?

(1) දුන් වට්ටම් ගිණුම හර
ණය හිමි ගිණුම බැර

(2) දුන් වට්ටම් ගිණුම හර
මුදල් පොත බැර

(3) මුදල් ගිණුම හර
දුන් වට්ටම් ගිණුම බැර

(4) දුන් වට්ටම් ගිණුම හර
ණය ගැති ගිණුම බැර

38)ගිණුම්වල සටහන් නොකරන නමුත් මූලාශ්‍ර ලේඛනවල පමණක් සටහන් කරන වට්ටම් වර්ගය වන්නේ

(1) මුදල් වට්ටම් ය (2) දුන් වට්ටම් ය

(3) ලද වට්ටම් ය (4) වෙළඳ වට්ටම් ය

39)පහත සඳහන් ගනුදෙනු අතරින් සුළු මුදල් පොතේ ලෙජර් ගිණුම් තීරුවේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,

(1) සිල්වා ට රු.200ක් ගෙවීම (2) ගමන් ගාස්තු රු.100ක් ගෙවීම

(3) ලිපිද්‍රව්‍ය සඳහා රු.400ක් ගෙවීම (4) තැපැල් ගාස්තු සඳහා රු.150ක් ගෙවීම

40)ලසිත්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් වටිනාකම රු.3 000 කි. මාර්තු මාසය තුළ ඉන් රු.2 800ක් වියදම් කර තිබුණි. සුළු මුදල් අග්‍රිමය ප්‍රමාණවත් නොවන නිසා එය රු.4 000ක් දක්වා වැඩි කොට මාර්තු 31 දින ප්‍රතිපූර්ණය කරන ලදි. ප්‍රතිපූර්ණ කරන ලද මුදල කොපමණ ද?

(1) රු.200 කි (2) රු.4 200 කි (3) රු.4 000 කි (4) රු.3 800 කි